## ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතික කිරීමේ අරමුදල - 2012

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ පියවීම් සහතිකකිරීමේ අරමුදලෙහි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

#### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර තිබුණු මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ කටයුතුවලින් වූ ප්‍රතිඵලය රු.42,095,856 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූපී අතිරික්තය රු.24,823,597 ක් වුයෙන් රු.17,272,259 ක අතිරික්තයේ වැඩිවීමක් දැක්වුණි.

#### 2.2 අරමුදලේ තත්ත්වය

අරමුදලේ තත්ත්වය ශක්තිමත් කිරීමේ අදහසින් 2011 ජුලි 13 දිනැති අංක 2008 දරන සංශෝධිත භාර ඔප්පුව ප්‍රකාර 2012 ජනවාරි මාසයේදී කොළඹ කොටස් හුවමාරුව විසින් රු. මිලියන 100 ක මුදලක් අරමුදලට මාරුකර තිබුණි.

#### 2.3 අරමුදලේ කටයුතු

1998 මැයි 21/22 දිනැති අංක 1376 දරන භාර ඔප්පුවේ 5 (අ) වගන්තිය පරිදි මධ්‍යම තැන්පතු පද්ධතියේ නිශ්කාෂණ සාමාජිකයින් අතර අර්බුද වාර්තා වී නොතිබුණ අතර ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී කිසිදු වන්දි ගෙවීමක් සිදු කර නොතිබුණි.